**දිඹුලාගල ප්‍රාදේශීය සභාව**

**පොලොන්නරුව දිස්ත්‍රික්කය**

1. මූල්‍ය ප්‍රකාශන.

1.1. මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2011 මැයි 02 දිනද ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2010 මාර්තු 26 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණි.

1.2 මතය.

මෙම වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් හේතුකොට ගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති දිඹුලාගල ප්‍රාදේශීය සභාවේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට මට නොහැකිය.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු.

විගණනයේදී නිරීක්ෂණය වූ ගිණුම්කරණ අඩුපාඩු පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

| | ගිණුම්කරණ අඩුපාඩුව | විෂයයන් ගණන | වටිනාකම |
|---|---|---|---|
| | | | රු. |
| (i) | මූල්‍ය ප්‍රකාශනවලින් අත්හැරීම් | 08 | 1,399,950 |
| (ii) | මූල්‍ය ප්‍රකාශනවල වැඩියෙන් දැක්වීම් | 01 | 887,945 |
| (iii) | මූල්‍ය ප්‍රකාශනවල අඩුවෙන් දැක්වීම් | 02 | 106,442 |

1.3.2 ගෙවිය යුතු ගිණුම්

2010 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක සහ අවුරුදු 02 ක කාලයක් ඉක්මවා තිබුණු ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම පිළිවෙලින් රු. 113,079 ක් සහ රු. 365,362 ක් විය.

### 1.3.3 විගණනය සඳහා සාක්ෂි නොවීම.

තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොවීම නිසා එකතුව රු. 52,369,686 ක් වූ ගිණුම් විෂයයන් 08 ක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

### 1.3.4 අනුකූල නොවීම්

පහත දැක්වෙන නීති,රීති හා රෙගුලාසි විධි විධානවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති, රීති හා රෙගුලාසි විධිවිධාන වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 153,155 හා 160 වගන්ති | ගොඩනැගිලි, පාරවල්, පාලම්, ජල සම්පාදන හා ජලාපවහන හෝ කසල ඉවත් කිරීමේ පද්ධති ඉදිකිරීම් වෙනුවෙන් කරන ගෙවීම් සඳහා 1% ක රඳවාගැනීමේ බදු අයකර, එළඹෙන මාසයේ 15 වැනි දින හෝ එදිනට පෙර දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කළයුතු වුවත්, 2010 වර්ෂයේදී නිශ්චිත ගාස්තු මත අයකර ගත් රු. 44,145 ක රඳවාගැනීමේ බදු, 2011 පෙබරවාරි 15 දින වන විටත් ප්‍රේෂණය කර නොතිබුණි. |
| (ආ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | |
| | 19(1) (1) වගන්තිය | පළාත් පාලන කොමසාරිස්වරයාගේ ලිඛිත අවසරය ලබා නොගෙන ජල ව්‍යාපෘති 03 ක් සඳහා සේවකයින් 25 දෙනෙකු බඳවාගෙන සමාලෝචිත වර්ෂය තුළ වැටුප් වශයෙන් රු. 3,379,409 ක් ගෙවා තිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 1645(අ) | රු. 728,582 ක් වූ වාහන අළුත්වැඩියා කිරීම් සේවා කිරීම් සහ අමතර කොටස් මිලදී ගැනීම් සඳහා ලොග් සටහන් පොත් පවත්වා නොතිබුණි. |
| (ඈ) | 2007දෙසැම්බර් 19 දිනැති අංක 1528/21 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි | (i) සභාපතිවරයාගේ රාජකාරී ගමන් සඳහා මාසික ඉන්ධන සීමාව ඩීසල් ලීටර 400 ක් වුවද, අංක 252/6532 දරන කැබ් රථයට එම සීමාව ඉක්මවා ඩීසල් ලීටර් 1036 ක් සඳහා රු. 76,031 ක් |

ජනරජයේ ගැසට් පත්‍රය සමාලෝචිත වර්ෂය තුළදී වැයකර තිබුණි.

(ii) ප්‍රාදේශීය සභාවට වාහනයක් නොමැති අවස්ථාවක සභාපතිවරයාට මසකට නියම කර ඇති ඉන්ධන සීමාව තුළ පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය ලබාගෙන පෞද්ගලික වාහන සඳහා සහා අරමුදලින් වැය දැරිය හැකි නමුත් පළාත් පාලන කොමසාරිස්වරයාගේ අනුමැතියකින් තොරව රු. 47,482 ක ප්‍රවාහන වැය සභා අරමුදලින් දරා තිබුණි.

## 02. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය.

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු. 3,303,858 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු. 17,489,727 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය.

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිග ආදායම්.

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිග ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2010 | | | 2009 | | |
|---|---|---|---|---|---|---|---|
| | ආදායම් විෂයය | ඇස්තමේන්තු ගත | තථ්‍ය | දෙසැම්බර් 31දිනට සමුච්චිත හිගය | ඇස්තමේන්තු ගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිගය |
| | | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 |
| (i) | බදු කුලී | 5,243 | 4,826 | 750 | 4,508 | 5,737 | - |
| (ii) | බලපත්‍ර ගාස්තු | 528 | 657 | 424 | 487 | 529 | 340 |
| (iii) | වෙනත් ආදායම් | 8,027 | 18,340 | 1,926 | 15,780 | 17,572 | - |

2.2.2 උසාවි දඩ

විවිධ ආඥා පනත් යටතේ මහෙස්ත්‍රාත් අධිකරණයක් විසින් 2010 දෙසැම්බර් 31 දින දක්වා අයකර ප්‍රධාන ලේකම් වෙත එවා ඇති රු. 11,064,435 ක දඩ මුදල් සභාවට ලැබිය යුතුව තිබුණි.

2.2.3 වරිපනම් බදු අයකිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තියේ විධි විධාන අනුව දියුණු කළහැකි ප්‍රදේශ වශයෙන් ප්‍රකාශයට පත්කළ හැකි ප්‍රදේශ හඳුනාගෙන වරිපනම් බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.4 වෙනත් ආදායම්

(අ) 2005, 2006 සහ 2009 වර්ෂවලට අදාලව මිරිදිය මාළු විකිණීමේ වෙළඳ අයිතිය බදු දීම වෙනුවෙන් ලැබිය යුතු රු. 275,412 ක් අයකරගෙන නොතිබුණි.

(ආ) සභා බල ප්‍රදේශය තුළ, නාගරික ස්ථානවල හා ප්‍රධාන මාර්ග දෙපස සවිකර ඇති, විවිධ වෙළඳ ප්‍රචාරක දැන්වීම් පුවරු සඳහා ගාස්තු අයකිරීමට කටයුතු කර නොතිබුණි.

2.3 වියදම් ව්‍යුහය.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා සභාවේ අයවැයගත හා තථ්‍ය වියදම අදාල විචලනයන්ද සමග පහත දැක්වේ.

| | 2010 | | | 2009 | | |
|---|---|---|---|---|---|---|
| වියදම් විෂය | අයවැයගත | තථ්‍ය | විචලනය | අයවැයගත | තථ්‍ය | විචලනය |
| | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 |
| පුනරාවර්තන වියදම් | | | | | | |
| පෞද්ගලික පඩිනඩි | 9,734 | 12,214 | (2,480) | 8,818 | 10,034 | (1,216) |
| අනෙකුත් | 14,815 | 26,161 | (11,346) | 10,326 | 31,295 | (20,969) |
| උප එකතුව | 24,549 | 38,375 | (13,826) | 19,144 | 41,329 | (22,185) |
| ප්‍රාග්ධන වියදම | 589 | 12,589 | (12,000) | 1,431 | 1,355 | 76 |
| මුළු එකතුව | 25,138 | 50,964 | (25,826) | 20,575 | 42,684 | (22,109) |

සමාලෝචිත වර්ෂයේ රු. 24,548,743 ක් වූ ඇස්තමේන්තුගත පුනරාවර්තන වියදම ඉක්මවා 56% කට සමාන රු. 13,827,299 ක අධි වැයක් දරා තිබුණි.

## 2.4 මානව සම්පත් කළමනාකරණය.

2010 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | සේවක ශ්‍රේණිය | අනුමත | තථ්‍ය |
|---|---|---|---|
| (i) | මාණ්ඩලික ශ්‍රේණිය | 02 | 02 |
| (ii) | ද්විතීයික ශ්‍රේණිය | 12 | 08 |
| (iii) | ප්‍රාථමික ශ්‍රේණිය | 13 | 11 |
| (iv) | වෙනත් (අනියම්, තාවකාලික) | - | 44 |
| | | 27 | 65 |

## 2.5 වත්කම් කළමනාකරණය.

### 2.5.1 නිශ්ක්‍රීය භෞතික සම්පත්.

පහත විග්‍රහ කර ඇති පරිදි ඇතැම් වත්කම් නිශ්ක්‍රීයව පැවති බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | වත්කම් වර්ගය | ඒකක ගණන හෝ ප්‍රමාණය | නිශ්ක්‍රීයව තිබූ කාලය අවුරුදු |
|---|---|---|---|
| (i) | 75-0892 අත් ට්‍රැක්ටරය | 01 | 04 ට වැඩි |
| (ii) | 159-7115 යතුරු පැදිය | 01 | 03 ට වැඩි |
| (iii) | සහල් පිටි කිරීමේ හා ඒ ආශ්‍රිත ආහාර නිෂ්පාදන යන්ත්‍ර | 01 | 02 ට වැඩි |

### 2.5.2 ලැබිය යුතු ගිණුම්

2010 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු. 14,270,121 ක් වූ අතර, අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබුණු ගිණුම් ශේෂයන්හි එකතුව රු. 441,187 ක් විය.

2.5.3 අයවීමට ඇති සේවක ණය

2010 දෙසැම්බර් 31 දිනට අයවීමට තිබුණු සේවක ණය සහ අත්තිකාරම් ශේෂවල එකතුව රු.1,094,930 ක් වූ අතර, අවුරුදු 01 ක කාලයක් ඉක්මවා අයවීම් හිඟ හිටි සේවක ණය සහ අත්තිකාරම් ශේෂවල එකතුව රු.4.054 ක් විය.

2.6 මෙහෙයුම් අකාර්යක්ෂමතා

ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ වීථි පහන් නඩත්තු කිරීම සඳහා දරන ලද වියදමෙන් යම් ප්‍රමාණයක් ප්‍රතිපූර්ණය කරගැනීම සඳහා ලංකා විදුලි බල මණ්ඩලය සමඟ ගිවිසුමකට එළඹෙන ලෙස 1988 මාර්තු 16 දිනැති අංක PC/PE/12/91දරන විදුලි බල හා බලශක්ති අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ චක්‍රලේඛයෙන් උපදෙස් දී තිබුණු නමුත් ඒ අනුව කටයුතු නොකිරීම නිසා සමාලෝචිත වර්ෂයේදී වීථි පහන් නඩත්තු කටයුතු සඳහා වැයකර තිබුණු රු. 657,857 න් කිසිදු මුදලක් ප්‍රතිපූර්ණය කරගැනීමට සභාවට නොහැකිවී තිබුණි.

2.7 කාර්ය සාධනය

සංයුක්ත සැලැස්මක් හා ක්‍රියාකාර සැලැස්මක් නොවීම

(i) 2010 මාර්තු 10 දිනැති අංක PF/R/2/2/3/5(4) දරන මහා භාණ්ඩාගාර චක්‍රලේඛයේ 5(I) ප්‍රකාරව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 03 වගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති කාර්යයන් ඉදිරි වර්ෂවලදී ඉටුකිරීමට සැලසුම් කර ඇති ආකාරය දැක්වෙන සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

(ii) සභාවේ අරමුණු ඉටුකර ගැනීම සඳහා මූල්‍ය, මානව හා භෞතික සම්පත් නිසි කළමනාකරණ ප්‍රවේශයකට යොමුකර ගැනීම සඳහා සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාර සැලැස්මක් (මූල්‍ය හා භෞතික) පිළියෙල කර නොතිබුණි.

2.8 අභ්‍යන්තර විගණනය.

සමාලෝචිත වර්ෂයේ හා පූර්ව වර්ෂයන්හි සභාව තුළ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

3 පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානයක් යොමු කෙරේ.

(අ) ගිණුම්කරණය

(ආ) අභ්‍යන්තර පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ) වත්කම් කළමනාකරණය

(ඉ) ණයගැති හා ණයහිමි පාලනය